# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/24 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(70)/76.

**(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥපනත**

අගමැතිගේ නිර්දේශය අනුව, මහාජන ආරක්ෂක ආඥපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

**වි. ගොපල්ලව,**
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග හදිසි අවස්ථා (රජයේ දේපළ ආරක්ෂා කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) දුම්රිය දෙපාර්තමේන්තුවට, විදුලි සංදේශ දෙපාර්තමේන්තුවට, ලංකා ගමනාගමන මණ්ඩලයට හෝ ලංකා විදුලිබල මණ්ඩලයට අයත් දේපළක් නීත්‍යානුකූල බලයක් හෝ සාධාරණ හේතුවක් නොමැතිව තම සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි තබා ගෙන සිටින හෝ ඒ දේපළ සොරකම් කරන හෝ ඒ දේපළට අනර්ථයක් සිදු කරන කවර හෝ තැනැත්තෙක් වරදක් කරන්නේය. එවැනි නීත්‍යානුකූල බලයක් හෝ සාධාරණ හේතුවක් තමාට ඇති බව ඔප්පු කිරීම එවැනි නීත්‍යානුකූල බලයක් හෝ සාධාරණ හේතුවක් ඇතැයි කියා සිටින තැනැත්තා විසින් කළ යුතු ය.

මේ ඡේදයෙහි " සොරකම් " සහ " අනර්ථය " යන්නට දණ්ඩ නීති සංග්‍රහයෙහි ඒ සඳහා පිළිවෙලින් දී ඇති අර්ථම ඇත්තේ ය.

(2) ප්‍රස්තුත දේපළ අවස්ථාවෝචිත පරිදි දුම්රිය දෙපාර්තමේන්තුවට, විදුලි සංදේශ දෙපාර්තමේන්තුවට, ලංකා ගමනාගමන මණ්ඩලයට හෝ ලංකා විදුලිබල මණ්ඩලයට අයත් යයි සහතික කරමින් මෙහි උපලේඛනයේ II වන තීරයෙහි සඳහන් දෙපාර්තමේන්තුව හෝ මණ්ඩලය සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ I වන තීරයේ අනුරූප සටහනේ සඳහන් නිලධරයකුගේ අත්සන යටතේ වූවක් යයි කියනු ලබන සහතිකයක් අධිකරණයක දී පිළිගනු ලැබිය යුතු අතර එය එහි ඇතුළත් ප්‍රකාශවල සත්‍යතාව පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂ්‍යය වන්නේ ය.

(3) මේ නියෝගය යටතේ වරදක් කරන කවර හෝ තැනැත්තෙක් මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට, අවුරුදු පහකට නොඅඩු වූ ද, අවුරුදු හතක් නොඉක්මවන්නා වූ ද බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් වන්නේ ය.

උපලේඛනය

| I වන තීරය | II වන තීරය |
| --- | --- |
| දුම්රිය සාමාන්‍යාධිකාරී<br>ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු<br>සංඥා හා විදුලි සංදේශ ඉංජිනේරු<br>ප්‍රධාන ඉංජිනේරු, මාර්ග හා වැඩ<br>ධාවන බල අධිකාරී | දුම්රිය දෙපාර්තමේන්තුව |

උපලේඛනය—(සම්බන්ධයි)

| I වන තීරය | II වන තීරය |
|---|---|
| දුම්රිය ගබඩා අධිකාරී<br>දිස්ත්‍රික් ඉංජිනේරු<br>දිස්ත්‍රික් අධිකාරී | දුම්රිය දෙපාර්තමේන්තුව |
| ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු<br>අධිකාරී විදුලි සංදේශ ඉංජිනේරු<br>ප්‍රාදේශීය විදුලි සංදේශ ඉංජිනේරු | විදුලි සංදේශ දෙපාර්තමේන්තුව |
| ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු (නිෂ්පාදන)<br>ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු (නඩත්තු)<br>ප්‍රධාන සැපයුම් නිලධාරී<br>ප්‍රධාන සිවිල් ඉංජිනේරු<br>ප්‍රධාන ධාවන කළමනාකරු<br>නඩත්තු ඉංජිනේරු<br>ප්‍රාදේශ ඉංජිනේරු<br>ප්‍රාදේශ පාලක<br>වැඩ ඉංජිනේරු<br>ඩිපෝ අධිකාරී | ලංකා ගමනාගමන මණ්ඩලය |
| සාමාන්‍යාධිකාරී<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී<br>ප්‍රාදේශීය කළමනාකරු | ලංකා විදුලිබල මණ්ඩලය |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී